# සොයුරියකගේ හදින්



පසුගිය වෙසක් පොහෝ දිනය හරි අපූරු එකක් උනා. සෑම වෙසක් එකකටම කරන සුපුරුදු චර්යාවෙන් මිදිලා අපි ටිකක් වෙනස් විදිහට තමයි මේ සැරේ වෙසක් අසිරිය වින්දේ. අවංකවම කියනවා නම් අපි මේ ඔස්ට්‍රේලියාවෙදි සමරන වෙසක් උත්සව ගැන මට ඇත්තේ පොඩි සාංකාවක්. අපි හැමෝම වෙසකා දවසට මෙල්බන් වල ඇති පන්සල් කරා ඇදෙන්නේ වන්දනාමාන කරන්නද? තොරණ බලලා පොලිමේ ඉඳලා ආප්ප කාලා හිත මිත්‍රාදීන් හමුවෙලා එන්නද? ඇත්තටම ආහාර සල්පිල් දාන්නේ පුන්‍ය චේතනාවෙන් තමයි. ඒත් මේ පොයදාට ආහාර සල්පිලට ප්‍රධාන තැනක් දෙන එක නම් ඔබින්නෙ නැහැ වගේ. ඒකෙන් වෙන්නෙ මිනිස්සු පන්සලට එන චේතනාව අරමුණු නොදැනීම වෙනස් වෙන එකයි. විහාරස්ථානයක දියුනුව උදෙසා මූල්‍යමය අවශ්‍යතාවන් පැන නිගිනවා. ඒ සඳහා අපි විවිධ ක්‍රම යොදා ගත යුතුයි. එහෙත් ඒවා සිදුවිය යුත්තේ පන්සල් භූමියෙන් බැහැරවයි. විශේෂයෙන් වෙසක් දවසට පන්සලේ කොත්තු කඩ දාන එක ගැලපෙන්නේ නැහැ නේද? වෙසක් දිනයට වත් අපේ අරමුණු ධර්මයට සීමා කරන්න උත්සාහ ගමු නේ ද?

පන්සලක තිබිය යුත්තේ නිහඬ ශාන්ත බවක්. අපේ සිත් පහන් වෙන්නේ එතකොට නේද? බෝපත් සෙලවෙන හඬ ඝන්ටා නාද, පිරිත් හඬ, මේවා නේද අපි පන්සලක දකින අහන දේ..? නිකමට හිතන්නන ධම්මසරණ විහාරයේ චෛත්‍යය ගැන. මොන තරම් ශාන්ත බවක් සිසිලසක් ද අපට එතනට ගියාම දැනෙන්නෙ. කොහොමද එතන කොත්තු කඩයක් දැම්මොත්. ඇත්තටම අපි නොදැනුවත්වම අපට අහිතකර දේ මොනතරම් නම් කරනවද? ස්වාමීන් වහන්සේලාටත් දහම් පාසලටත් පමනම් සමාජයජ් ගොඩ නගන්න අමාරුයි.

අපි මේ සැරේ වෙසක් දිනය ගත කළේ නගරයෙන් ඈත කැලෑබද පෙදෙසක නවාතැනක. ඒ මේරිස්විල් වල. අපි උදේ වරුව වොබර්ටන් ආරාමටය ගිහින් ඒ අවට ගත කළා. එදා රාත්‍රිය අපි ගත කලේ මේරිස්විල් වල නවාතැනේ. අපේ නවාතැන තිබුනෙ කැලෑව අද්දර පුංචි දොලපාරක් ළඟ'. උදේ වරුවේ මහන්සිවෙලා හිටපු දරුවෝ කලින්ම නින්දට ගියා. නවාතැනේ පිලට වෙලා අපි බොහෝ රෑ වෙනකම් හිටියා. වෙසක් සඳ අහසේ නැගෙමින් තිබුණා. ඒක හරි අපූරු රාත්‍රියක්. හරිම සුන්දර දදුනක්. කොහොමත් පෝය හඳට අපි ඇලුම් කරනවවේ. වෙසක් කියනකොට අපේ හිතේ මැවෙන පොදු චිත්‍රයක් තියෙනවනෙ. වටකුරු බෝල හඳක්. බෝකොලයක්, වෙසක් කූඩුවක්..


<u>*වෙසක් කියනකොට අපේ හිතේ මැවෙන පොදු චිත්‍රයක් තියෙනවනෙ. වටකුරු බෝල හඳක්. බෝකොලයක්, වෙසක් කූඩුවක්.. ඇත්තටම අමේ රටෙන් දුර බැහැර රටක කැලෑබද නවාතැනක ඉඳන් දකින හඳත් අපේ රටේ ගමේ වවට උඩින් කන්දෙන් මතුවෙලා එන හඳෙනුත් හිතට දැනෙන්නෙ එකම චමත්කාරයමයි.*</u>

ඇත්තටම අමේ රටෙන් දුර බැහැර රටක කැලෑබද නවාතැනක ඉඳන් දකින හඳත් අපේ රටේ ගමේ වවට උඩින් කන්දෙන් මතුවෙලා එන හඳෙනුත් හිතට දැනෙන්නෙ එකම චමත්කාරයමයි. ඒ රාත්‍රියේ පාලු නිහඬ බව , රාත්‍රියේ ගුප්ත ස්වභාවය, රැහැයියන්ගේ හඬ, අසල දොල පාරේ වතු ගලන හඬ.. මේ හැම දෙයක්ම අතරේ ඉන්න කොට හිතට දැනෙන්නෙ අප්‍රමාන සුවයයි. හැමදේකින්ම මිදුන බවක්.

මෙහෙම ඉන්න අතරේ ජයෙත් මාත් බොහෝ දේ රෑ දෙගොඩහරි යාමේ වෙනකල් කතා කළා. අපේ ජීවිත ගැන. අපේ ජන සමාජය බුද්ධ දර්ශනය එක්ක ගැලපෙන ආකාරය. චතුරාර්ය සත්‍යය ගැන. ආර්ය අෂ්ඨාංගික මාර්ගය ගැන. ඒ ගැන කතා කරන්න මොන තරම් දේ තියෙනවද? බුදු දහම ලෝකෝත්තර දහමක් කියලා කිව්වට භෞතික ජීවිතයටයි ඒක වඩා වැවදගත් වෙන්නෙ. සෑම විටම අපි මේ දහමට ලං වෙන්නෙ අපේ ජීවිත වල අවසාන භාගයේදි. ඒ යන තැනට වැඩ සලසගන්න. කිසි විටෙක අපි ජීවිතේ ආරම්භ අවධියේදී මේකට අනුව ජීවිත හැඩ ගහගන්න උත්සාහ ගන්නෙ නැහැ. සැබෑ ලෙසම බුද්ධ දර්ශණය වැදගත් වන්නෙ ජීවත් වෙන්නයි. මිය පරලොව ගියාම නෙවෙයි. ඇත්තටම මේ ලෞකික ජීවිතය සාර්ථක කරගන්න බුදු දහමින් ලැබෙන පිටුවහල ගැන හරියටම දන්නේ, දැනගන්න උත්සාහ කරන්නේ කීයෙන් කී දෙනා ද? දහසක් දුක් විඳි අපේ රටේ ඉඳලා මේ රටට ඇවිත් මේ පාරිභෝගික සමාජය තුල වල්මත් වෙමින්, සැප සම්පත් ලබා ගැනීම උදෙසා එකිනෙකා පරයමින් දුවන මේ ගමන නතර වෙන්නෙ කොතනද?

අඩුම තරමින් අපි වෙසක් දිනයකදීවත් බුදුන් වහන්සේ වදාල ධර්මය අවබෙබ්ධ කරගන්න උත්සාහ ගනිමු. අවිාාවෙව් මිදෙන්න උත්සාහ ගනිමු. මිනිසෙකු වී ඉපිද දිනිසෙකු ලෙස ජීවව් වී මිනිසුකෙු ලෙස පිරිනිවව් පෑ තිලෝගුරු බුදුන් විසින් වදාල බුද්ධ දර්ශනය නමැති ඒ මනුෂ්‍ය බුද්ධියේ අසමාන අග්‍රඵලයෙන් අපි අබේ ජීවිත ආලෝකමත් කරගන්න "උත්සාහ ගනිමු.

සොයුරිය
ධරණී




**මිනිසාගේ** උපතේ සිට මරණය දම්වැලක පුරුකක් මෙන් ඇමිනී ඇත්තේ , ලොව උපන් කිසිවෙකු අමරණීය තත්වයට මෙතෙක් ලගා වී නොමැති බැවිනි. ගරණය ඉදිරියේ වේදනා විඳිමින් සැලෙන සිත් සුවපත්කර සන්සුන් ආකා රයට මරණය වැළඳ ගැනීම අපහසු කාර්යයකි. මරණය පිළිබඳ ඇති අනියත බිය , වේදනාව , ජීවිත වල තමා ලද අත් දැකීම් , මේ සියල්ල කැටිකොට ගත්කල මරණය දකින්නේ අතිශය අසුන්දර වූ ගමන් මාර්ගයක් ලෙසටය. අඥාන ලෙස දකින මරණය තුල අනිත්‍යය , අනාත්ම, දිරායාම් , ව්‍යාධි ගැබ්ව ඇතිබව මනසට වැටහෙන්නේ නම් , මරණය කිසිවෙකුට කම්පිත ගමන් මාර්ගයක් නොවනු ඇත.

මරණයේ සුන්දර බවත් අසුන්දර බවත් මිනිසා විසින්ම ඇති කර ගන්නා හොඳ හෝ නරක ක්‍රියාදාමයකි. සුන්දර බව , අසුන්දර බව මිනිසාගේ

## කාන්ති වික්‍රමසූරිය

සිත තුල පවතින සිතුවිලි සංකලනයකි. මරණය , ප්‍රියයන්ගෙන් වෙන්වීම, නිත්‍ය සාධකයක් බව ප්‍රඥාවෙන් හා උපේක්ෂාවෙන් පිළිගත යුතු සිද්ධාන්තයකි. ඵ්‍රසන්න ලෙස මරණයට මුහුණ දීමේ ආත්ම ශක්තිය ලබා ගැනීම සඳහා භාවනා පිළිවෙතට එළඹෙන්නැයි බුදුන් වහන්සේ වදාලේ එබැවිනි.

අනිච්ඡා වත සංඛාරා " (සියළු සංස්කාරක ධර්මයෝ අනිත්‍ය ) යයි මිනිසා වටහා ගන්නේ නම් , සිහි බුද්ධියෙන් මරණයට මුහුණ දීමට අපහසු නොවනු ඇත. තථාගතයන් වහන්සේ දේශනා කළ පරිදි මරණයට සිහියෙන් හා සැනසීමෙන් මුහුණදීමට නම් අප දියුණුකළ යුත්තේ මනසයි. එහෙත් මිනිසාට දුෂ්කරම කාර්යය වන්නේද එයයි. අකම්පිත මරණයක් කරා යාමට සිත දියුණුකිරීම මහත් ඕනෑකමකින් හා උත්සාහයෙන් කළයුතු වන්නේය.

රමණීය ජීවිත ගතකළ බොහෝ අයෙකු මිය යන්නේ , රමණීය ලෙසටය. දුටුගැමුණු රජුගේ මරණාසන්න මොහොතේ සතර වරම් දෙවිවරු මලාදාමයන් පෙන්වා දුටුගැමුණු රජුට දිව්‍ය ලෝකවලට වඩින්න යැයි ආරාධනා කලේ රජතුමා අසූහාර දහසක් වෙහෙර විහාර ගොඩ නංවා රුවන්වැළි මහා සෑයේ නිම නොකළ සෑ මළුව දෙස බලා සිටිද්දීය.

මිනිසා කුමන ආගමකට , ජාතියකට අයත් වූවත් ආගම් වල පුළුල් හරය වී ඇත්තේ , නෝබෙල් ත්‍යාග ලාභී දලයි ලාමා පවසන ලෙසට හැම ආගමකම හරය සෙනෙහසයි. මිනිසාගේ ක්‍රියාව මිනිසෙකු කරනවා විනා , බුදුන්වහන්සේ දේශණා කළ පරිදි උත්පත්තියෙන් කිසිවෙකු වසලයෙකු හෝ බ්‍රාහ්මණයෙකු නොවේ.

කිතුණුවන් මිය යද්දී , දෙවියන්ගේ ආලෝකය , දෙවියන් දුටු අය ගැන සඳහන් වන්නාක් මෙන්ම බෞද්ධයන් අතරද විවිධ ආලෝකතල , දේව රූප, බුදුන්වහන්සේ දුටු අය ගැන පවා පොත පතෙහි සඳහන් වී ඇත.එසේ නම් මරණය ජුගුප්සාජනක බියගෙන දෙන්නක් නොවේ යයි ප්‍රඥාවෙන් යුතුව කල්පනා කරන මනසකට වැටහෙනු ඇත.
මරණය ප්‍රසන්න අත්දැකීමක් කර ගන්නට නම් , දිරාපත් වූ ශරීරය දෙස බලා , ජීවත්ව සිටි කාලය තුල හොඳ පමණක් කළාය යන සිතුවිල්ල අවංකව හදතුල ගලා එන්නේ නම් , මරණයේ අප්‍රසන්න බව මැකී මතු වන්නේ සුන්දරත්වයකි. මරණයේදී අවසන් හුස්ම බිඳ හෙලීමට තැත් දරන අප ආදරය කරන , ප්‍රේම කරන පුද්ගලයා ඉදිරියේ අඬා වැලපීම , ඔහුගේ පෘතග්ජන සිතට ආවේග , ආශාවන් ඇතිකිරීම ඔහුට කරන බලවත් අසාධාරණයකි. ඇත්තෙන්ම

28 වන පිටට